# රබර් වගාවේ රෝග පිළිබඳ ඉතිහාසයේ පියසටහන්

සී.කේ. ජයසිංහ සහ එන්. ජයවර්ධන



20වන ශත වර්ෂය ආරම්භයේදී ලංකාණ්ඩුවේ දිලීර විද්‍යාඥවරයා ලෙස සේවය කළ ටී. පෙච්

ශ්‍රී ලංකාවේ රබර් රෝග පිළිබඳ ඉතිහාසය 20 වන ශත වර්ෂයේ මුල් භාගය දක්වා දිව යයි. වසර 1900 වන විට ශ්‍රී ලංකා භූමියෙන් හෙක්ටයාර් 1,500 ට කිට්ටු ප්‍රමාණයක් රබර් වගාවෙන් වැසී පැවතුන අතර මෙම ශාකයේ රෝග පිළිබඳ වගකීම පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය කේන්ද්‍ර කරගනිමින් සිය සේවාව ඉටු කළ ලංකාණ්ඩුවේ දිලීර විද්‍යාඥවරයා වෙත පැවරී තිබුණි.

රබර් වගාව තෙත් කලාපයේ ආකර්ශනීය ලෙස ව්‍යාප්ත වීමත් සමඟ එම ශාකය නොයෙකුත් අසාමාන්‍යතා වලට ගොදුරු වීම ආරම්භ විය. මෙම වැවිලි භෝගයෙහි පළමු රෝගය වාර්තා කිරීමේ ගෞරවය හිමි වන්නේ 1903 වසරේදී ලංකාණ්ඩුවේ දිලීර විද්‍යාඥයා ලෙස සේවය කළ ජේ.බී. කැරුතස් මහතාටය. කළුතර ප්‍රදේශයේ රබර් වගාවන් කඳ සහ අතුවල හටගන්නා පිළිකාමය (Canker Disease) තත්වයකින් පීඩාවට පත් වූ අතර එම රෝගය ඇති වීමට හේතුව නෙක්ට්‍රියා (*Nectria* sp.) නැමැති දිලීරය ආක්‍රමණය බව 1903 වසරේ ඔක්තෝබර් මස 31 වන දින තෙබුවන තානායමේදී කළුතර දිස්ත්‍රික්කයේ රබර් වැවිලිකරුවන්ගේ සංගමයේ විශේෂ රැස්වීමක් කැඳවා මෙම විද්‍යාඥයා විසින් අනාවරණය කරන ලදි.

ශ්‍රී ලාංකිය රබර් රෝග පිළිබඳ ඉතිහාසය මෙසේ ආරම්භ වූ අතර 1905 වසර වන විට ලංකාණ්ඩුවේ දිලීර විද්‍යාඥ පදවිය හෙබවූ ටී. පෙච් විසින් තවත් රබර් රෝග ගණනාවක් පිළිබඳ වාර්තා ඉදිරිපත් කළේය. මෙම ප්‍රකාශනවල ශ්‍රී ලංකාවේ පමණක් නොව එවකට රබර් වගාව ව්‍යාප්ත වී තිබූ සියළුම අග්නිදිග ආසියාතික රටවල රබර් වගාව පීඩාවට පත් කළ පත්‍රවලට වැළඳෙන දිලීර රෝග හයක් ද, මුල්වලට වැළඳෙන දිලීර රෝග දෙකක් ද, කඳට වැළඳෙන රෝගයක් පිළිබඳව ද, ගෙඩි කුණු වීමේ රෝගයක් පිළිබඳව ද, හඳුනා ගැනීම සහ පාලනය කිරීම පිළිබඳව ද කරුණු ඇතුලත් විය. මේ සමඟම රබර් රෝග හඳුනා ගැනීම, ව්‍යාධිජනකයින්ගේ ජීවන ප්‍රවෘත්ති, රෝග කාරකයින් සහ පරිසර සාධක අතර සම්බන්ධතා, රෝග වළක්වා ගැනීම සහ මර්ධනය පිළිබඳ පරීක්ෂණ ආරම්භ විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස රෝග සම්බන්ධයෙන් සිදු කරන පර්යේෂණවල කේන්ද්‍රස්ථානය බවට ශ්‍රී ලංකාව පත් වූ අතර අද දක්වා වූ මෙම දීර්ඝ ගමනේදී ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් සේවාවක් ඉටු කිරීමට ශ්‍රී ලංකාව සමත් වී ඇත. මේ වනවිට රබර් වගාකරන සියළුම රටවල් වල රබර් රෝග පිළිබඳ කෙරෙන පර්යේෂණ වල සම්බන්ධිකරණය සිදුකිරීමේ වගකීමද දරනුයේ ශ්‍රී ලංකාව විසිනි.

විසිවන ශත වර්ශයේ මුල් දශක කිහිපය වන විට රබර් වගාව ආක්‍රමණය කළ හැකි දිලීර 45කට ආසන්න සංඛ්‍යාවක් සොයා ගැණුන අතර එම රෝගවලින් රබර් ශාකය ආර්ථික වශයෙන් පීඩාවට පත් වූ රෝග පිළිබඳව වගුව 1 හි දක්වා ඇත.

වගුව 1. *විසිවන ශත වර්ෂයේ මුල් භාගයේදී ශ්‍රී ලාංකීය රබර් වගාවට තර්ජනයක් වූ රෝග සහ රෝග කාරකයන්*

| රෝගය | රෝගකාරකයා |
|---|---|
| කුරුළු ඇස් රෝගය | *Bipolaris* sp. |
| ග්ලියොස්පෝරියම් පත්‍ර රෝගය | *Colletotrichum* spp. |
| කඳ රෝස පැහැ වීමේ රෝගය | *Corticium* sp. |
| අශ්ව කෙඳි අංගමාරය සහ සූත්‍රිකා අංගමාරය | *Marasmium* spp. |
| දැලි පුස් | *Meliola* sp. |
| ඔයිඩියම් පත්‍ර පතනය | *Oidium* sp. |
| දුඹුරු මුල් රෝගය | *Phellinus* sp. |
| ප්‍රතිමාරය | *Botryodiplodia* sp. |
| ප්‍රතිමාරය | *Diplodia* sp. |
| ප්‍රතිමාරය | *Phoma* sp. |
| ප්‍රතිමාරය | *Phomopsis* sp. |
| පයිටොප්තෝරා පත්‍ර පතනය හා කඳ කුණුවීමේ රෝගය | *Phytophthora* sp. |
| පෝරියා මුල් රෝගය | *Poria* sp. |
| සුදු මුල් රෝගය | *Rigidoporus* sp. |
| උස්ටුලිනා මුල් රෝගය හා කඳ කුණුවීමේ රෝගය | *Ustulina* sp. |
| කළු මුල් රෝගය | *Xylaria* sp. |

මෙම වකවානුව වන විට රෝග කාරකයන් පිළිබඳව මෙන්ම මෙම රෝග හඳුනා ගැනීම සහ ඒවා මර්ධනය කිරීම පිළිබඳව ඉතා වටිනා ග්‍රන්ථ සහ ප්‍රකාශන කීපයක් එළි දැක්වින. ඒවා අතර 1911 දි ටී. පෙච් විසින් රචිත "The Physiology and Diseases of *Hevea brasiliensis*" නැමති ග්‍රන්ථය ඉතා වැදගත් තැනක් ගනී. මෙය රබර් රෝග පිළිබඳ ප්‍රකාශයට පත් කරන ලද ප්‍රථම ග්‍රන්ථය ද වන්නේය. ඊළඟ දස වසර තුළ රබර් රෝග පිළිබඳ තව දුරටත් අධ්‍යයන දියත් කළ අතර 1920 වන විට රබර් වගාවන්හි ව්‍යාප්තව තිබූ රෝග පිළිබඳ ඉතා පුළුල් අවබෝධයක් ලබා ගැනීමට විද්‍යාඥයින් සමත්



Exhibit showing Control of Oidium by Sulphur Dusting at Jubilee Industrial Pageant.

රබර් වගාවට වැළඳෙන ඔයිඩියම් නැමැති රෝගය මර්ධනය කිරීම සඳහා ගෙන්දගම් ඉසීම ප්‍රචලිත කිරීමට සංවිධානය කරන ලද පෙරහැරක් (1935)

විය. මෙම අධ්‍යයන තුළින් 1921 දී බිහිවූ "The Diseases and Pests of the Rubber Tree" නැමති ග්‍රන්ථය මේ දක්වා පළවූ රබර් රෝග පිළිබඳ විස්තරාත්මක ග්‍රන්ථය ලෙස සලකනු ලැබේ. මෙහි කතුවරයා වුයේද ලංකාණ්ඩුවේ උද්භිද විද්‍යාඥ හා දිලීර විද්‍යාඥ ටී. පෙච්ය. පසුකාලීනව පළවූ ජේ.එච්. වෙයර් (1926) විසින් රචිත "A Pathological Survey of the Para Rubber Tree (*Hevea brasiliensis*) in the Amazon Valley" සහ ආර්.කේ.එස්. මුරේ (1930) ගේ "Diseases of Rubber in Ceylon" නම් වූ ග්‍රන්ථ දෙක එම වකවානුවේ පැවැති රබර් රෝග හා පාලනය පිළිබඳ ලියැවුනු තවත් වැදගත් ප්‍රකාශන දෙකක් විය. ඉන්පසු එළඹුනු කාල පරිච්ඡේදයේදී යුරෝපිය සහ ශ්‍රී ලාංකික විද්‍යාඥයින් විසින් ජාත්‍යන්තර මට්ටමේ ඉතා වැදගත් සොයා ගැනීම් අලලා සකසන ලද ප්‍රකාශන සිය ගණනක් ප්‍රකාශයට පත් කර ඇති අතර ඒ සඳහා දායක වූ විද්‍යාඥයින් අතරින් පී. ප්‍රයිස්, ඒ. රිජන්බාක්, එච්.ප. යංග්, ආචාර්ය ඕ.එස්. පිරිස් සහ ආචාර්ය ඒ. ද එස්. ලියනගේ යන විද්වතුන්ට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි.

මෑත ඉතිහාසය වන විට ලෝකයට දායාද කළ පර්යේෂණ කෘති සංඛ්‍යාව 500 ටත් වඩා වැඩි ප්‍රමාණයක් වන අතර ඒ පිළිබඳ දායකත්වය ඉසිලූ සියළුම විද්වතුන්ගේ නාම ලේඛනය සහ ප්‍රකාශනවල විස්තර ඇතුලත් ආචාර්ය සී.කේ. ජයසිංහ මහතා විසින් සකසන ලද "Literature Guide to Rubber Pathology : National Bibliography since the Establishment of the Rubber Tree" නැමති ග්‍රන්ථ නාමාවලිය සියවස සැමරුම් ප්‍රකාශනයක් ලෙස මෙම වසරේදී එළි දැක්වීමට නියමිතය.

විසිවන සියවසේ මැද භාගය වන විට ප්‍රචලිතව තිබූ ඉතා අනර්ථකාරී රෝග වුයේ ඔයිඩියම් පත්‍ර පතනය, ග්ලියස්පෝරියම් පත්‍ර පතනය, පයිටොප්තෝරා පත්‍ර පතනය සහ රබර් ශාකයේ පොතු කුණුවීමේ රෝගයයි. මේ සමගම සුදු මුල් රෝගයද ඉතා අනර්ථකාරී ලෙස රබර් වගා කරන ලද සියළුම ප්‍රදේශවල ව්‍යාප්ත වීම ඇරඹිනි. මෙම කාලය වන විට රෝග ව්‍යාප්ත වීම නිසා ශාක මිය යෑමට අමතරව ඒවායේ වර්ධනය අඩපණ වීමත් ඵලදාව අඩු වීමත් රබර් වගාකරුවන් පැහැදිලිව අවබෝධ කර ගෙන තිබුණු අතර එම රෝගී තත්වයන් පාලනය කිරීම සඳහා අධික වෙහෙසක් දැරීමට ද සිදු විය.



රබර් වගාවේ පත්‍ර රෝග මර්ධනය සඳහා දිලීර නාශක යෙදීම 20වන ශත වර්ෂයේ මැද භාගයේදී අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර පුරුද්දක් විය.

රෝග පාලනය කිරීමේ එකම ක්‍රම වේදය ලෙස එවකට නිර්දේශ කරනු ලැබුවේ රසායනික ද්‍රව්‍ය ඉතා විශාල ප්‍රමාණවලින් වසර පුරා රබර් ශාක වලට ඉසීමය. මෙම කාලයේ දී කඳු බෑවුම් සහිත බිම්හි වගා කරන ලද අඩි 40 ක් පමණ උස්වූ රබර් වගාවන්හි රෝග මර්ධනය සඳහා රසායනික ද්‍රව්‍යය ඉසීමට හැකි යන්ත්‍ර ශ්‍රී ලංකාවට ආනයනය කළ අතර ඒවා උපයෝගී කර ගෙන ශාක වියන සම්පූර්ණයෙන් වැසී යන පරිදි දිලීර නාශක යොදන ලදී. වසරේ මුල්භාගයේ කොළ හැලීමත් සමඟ නැවත දළුලන අවස්ථාවේ ගෙන්දගම් ඉසීමද නිරිත දිග මෝසම් සමයේදී තඹ අඩංගු දිලීර නාශක යෙදීමද එවකට රෝග මර්ධනය කිරීමේ ඉතා ජනප්‍රිය ක්‍රම වේදයන් විය. එම වකවානුවේදී රසායනික ද්‍රව්‍යවලට වැයවන වියදම හෝ ඉන් සිදුවන පරිසරහානිය පිළිබඳව සැලකිල්ලක් නොදැක්විනි.

එවකට යුරෝපීය ජාතික විද්‍යාඥයින්ගේ චින්තනයට අනුව පාලනය වෙමින් තිබූ ශාක ව්‍යාධි විද්‍යා දෙපාර්තමේන්තුව 1961 දී ලාංකීය විද්‍යාඥයින් අතට පත්විය. මෙම වකවානුව වන විට රෝග මර්ධනය සඳහා එකම මාර්ගය ලෙස රසායනික ද්‍රව්‍යය ඉසීම මෙරට රබර් වගා කරුවන්ගේ ආර්ථිකයට හා ශ්‍රී ලංකාවේ පරිසරයට තර්ජනයක් බව හඳුනාගත් ස්වදේශිය විද්වත්හු රෝග පාලනය සඳහා විකල්ප ක්‍රම සෙවීමට උත්සාහ ගත්හ. ඒ සමඟම රබර් රෝග පාලනය පිළිබඳ ඒකාබද්ධ පලිබෝධ පාලනය භාවිතයේ අඩිතාලම වැටුනු අතර එදා මෙදා තුර සිදුවූ වෙනස්කම් වගුව 2හි දක්වා ඇත.

වගුව 2. *රබර් වගාවන්හි රෝග පාලනය සඳහා වූ පැරණි සහ නව නිර්දේශ*

| රෝගය | පැරණි නිර්දේශය | නව නිර්දේශය |
|---|---|---|
| ඔයිඩියම් පත්‍ර පතනය | ශ්‍රී ලංකාවේ රබර් වගා කරන සියළුම ප්‍රදේශවල දළුලන කාලයේදී එනම් ඔයිඩියම් පැතිරෙන අවධියේදී වරකදී හෙක්ටයාරයකට ගෙන්දගම් 8kg/ha බැගින් වාර 10 - 12 ඉසීම. (සතියකට වරක්) | රෝගයට ඔරොත්තු දෙන ක්ලෝන නිපදවා ඇත. නමුත් අධික මීදුම සහිත ස්ථානවල වගාවන් සඳහා පමණක් රෝගය වසංගත තත්වයෙන් පැතිරෙන වසර වලදී ගෙන්දගම් ඉසීම නිර්දේශ කෙරේ. |
| පයිටොප්තෝරා පත්‍ර පතනය | නිරිත දිග මෝසම් කාලයේ (මැයි - සැප්තැම්බර්) තඹ අඩංගු දිලීර නාශක සතියකට වරක් යෙදීම. | රෝගයට ඔරොත්තු දෙන ක්ලෝන නිපදවා ඇත. රසායනික ද්‍රව්‍ය භාවිතය නිර්දේශ නොකෙරේ. |
| කොලටොට්‍රිකම් පත්‍ර පතනය | තෙත් දේශගුණික තත්වවලදී තඹ හෝ රසදිය අඩංගු දිලීර නාශක ඉසීම. | රෝගයට ඔරොත්තු දෙන ක්ලෝන නිපදවා ඇත. රසායනික ද්‍රව්‍ය භාවිතය නිර්දේශ නොකෙරේ. |
| කළු ඉරි රෝගය (පොතු කුණු වීම) | කැපුම් කට්ටයේ වසර පුරා ඇන්ටිමියුසින්, ෆයිලොමැක් 90 හෝ බෲනොලිනම් ආලේප කිරීම | නිර්දේශිත බොහෝ ක්ලෝන රෝගයට ඔරොත්තු දේ. පයිටොප්තෝරා වසංගතවලදී පමණක් ආරක්ෂාකාරී රසායනික ද්‍රව්‍ය නිර්දේශ කෙරේ. අවම අන්තරායක දිලීර නාශක වන බෲනෝලිනම් හෝ රිඩොමිල් නිරිතදිග මෝසම් කාලයේදී පමණක් ආලේප කිරීම. |
| සුදු මුල් රෝගය | පෙන්ටාක්ලෝරෝ නයිට්‍රොබෙන්සීන් නැමති අන්තරාකාරී රසායනික ද්‍රව්‍යය ග්‍රිස් මාධ්‍යයක අන්තර්ගත කොට මුල්වල ආලේප කිරීම. | අන්තරායක බවින් අඩු සංස්ථානික දිලීර නාශක ශාකයේ මුදුන් මුල තෙමී යන පරිදි වක් කිරීම. |

ඉහත වගුවෙන් පැහැදිළිව අවබෝධ වන පරිදි මේ වන විට රෝග පාලනය සඳහා ඇති නව නිර්දේශයන් ඉතා අඩු වියදම් සහිත වනවා පමණක් නොව පරිසරයට සිදුවන හානිය ද අවම කරයි. තවද, සමහර ඉතා වැදගත් රෝග, පාලනය සඳහා රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව ඇති නව ක්ලෝන වගා කිරීමට නිර්දේශ කර ඇති නිසා එම රෝග මර්ධනය කිරීම සඳහා කිසිදු මුදලක් වැය කිරීමට සිදු වන්නේ නැත. සමහර අවස්ථාවලදී දිලීර නාශක අවම වශයෙන් රෝග පාලනය සඳහා නිර්දේශ කර තිබුණද ඒවා අනතුරුදායක බවින් අඩු රසායනික ද්‍රව්‍යය බැවින්, මහා පරිමාණයේ පරිසර දූෂණයක් හෝ ජිවිත හානියක් හෝ ඉන් සිදු වන්නේ නැත.

නව සහශ්‍රය ආරම්භයත් සමඟ ශ්‍රී ලංකාවේ රබර් ශාකය ආක්‍රමණය කර ඇති සියළුම ව්‍යාධිජනකයින්ගේ නාම ලේඛනයක් ඇතුළත් “Check List of Rubber Pathogen in Sri Lanka” යන මාතෘකාව යටතේ ව්‍යාධි විද්‍යාඥයෙකු ලෙස සේවය කරන ආචාර්ය සී.කේ. ජයසිංහ මහතා විසින් ඉතා වැදගත් කෘතියක් එළි දක්වා ඇත. පළමු ව්‍යාධිජනකයා වාර්තා වීමෙන් වසර සියයකට ආසන්න කාලයකදී ඉදිරිපත් කළ මෙම ප්‍රකාශනයේ ව්‍යාධිජනකයින්ගේ ලේඛනයට අමතරව ආර්ථික වටිනාකමකින් යුතු රෝග පිළිබඳ විස්තරද ව්‍යාධිජනක ආක්‍රමණවල ඉතිහාසය සම්බන්ධයෙන් කරුණු ද විසිවන ශතවර්ෂයේ ආරම්භයේ සිටම ඉදිරිපත් කිරීමට විශාල පරිශ්‍රමයක් දරා ඇත. එම ලේඛනයට අනුව මේ වන විට රබර් වගාවේ අසාමාන්‍යතා ඇති කිරීමට සමත් රෝග කාරකයින් 63 දෙනෙකු වාර්තා ගතවී ඇති අතර එහි ව්‍යාධි ජනකයින් 60ක් දිලීර වර්ග වන අතර එක් වටපනු රෝගයක් ද, එක් වෛරසයක් ද, එක් ඇල්ගාවක් ද අන්තර් ගත වී ඇත. කෙසේ වෙතත් දැනට ලංකාවේ පවතින රබර් වගාව හා රබර් තවාන් ආශ්‍රිතව මූලික වශයෙන් රෝග 20 ක් පමණ ව්‍යාප්ත වී ඇත. මෙම රෝගවල තීව්‍රතාවය සහ වසංගත ලෙස පැතිර යාමේ අවදානම කාලගුණික තත්ව අනුව වසරින් වසර වෙනස් වේ. කාලගුණයට අමතරව මේ සඳහා බලපාන සාධක ලෙස එම කතුවරයා විසින් ඉදිරිපත් කර ඇත්තේ වගා කර ඇති ක්ලෝනය, වගාව ප්‍රතිස්ථාපනය කර ඇති ප්‍රදේශය හා මුහුදු මට්ටමේ සිට කොතරම් උසකින් පිහිටා ඇත්ද යන්නයි.

පසුගිය තිස් වසරක කාලය දෙස ආපසු හැරී බැලීමේදී රබර් ශාකයට වසංගත තත්වයෙන් වැළඳෙන රෝග වල විශාල වෙනස්කම් රාශියක් ඇතිවී ඇති බව පෙනී යයි. විසිවන ශතවර්ෂය ආරම්භයත් සමඟ ශ්‍රී ලාංකීය රබර් වගාවන් පීඩාවට පත්කළ ප්‍රධාන රෝග වන ඔයිඩියම් පත්‍ර පතනය, පයිටොප්තෝරා පත්‍ර පතනය සහ පයිටොප්තෝරා පොතු කුණු වීම මේ වන විට රබර් වගාවට සිදුකරන හානිය අවම තත්වයකට පත්වී ඇති බව පෙනී යයි. මේ පිටුපස ඇති රහස වන්නේ 1960 වසරේ සිට සිදුකරන ලද අති සාර්ථක අභිජනන වැඩසටහන් වන අතර එම ක්‍රියාවලියේ එක් මූලික අරමුණක් වූයේ සම්ප්‍රදායානුකූල රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව ඇති නව ක්ලෝන බිහි කිරීමයි.

කෙසේවෙතත්, 1905 වසරේ සිට ශ්‍රී ලංකාවේ ව්‍යාප්තවෙමින් පවතින සුදු මුල් රෝගය තවමත් ළපටි සහ පරිණත රබර් වගාවන්ට තර්ජනයක්ව පවතී. මේ වන විට රෝග මර්ධනය සඳහා රෝගී ශාකවල මූල පද්ධතිය පාදා “කොලර් ප්‍රොටෙක්ටන්ට්” නැමති රසායනික ද්‍රව්‍ය ආලේප කිරීම වෙනුවට සංස්ථානික දිලීරනාශක, ශාකයේ මූල පද්ධතිය තෙමී යන පරිදි වක්කිරීම නිර්දේශ කෙරේ. මෙම නව නිර්දේශය ඉතා කාර්යක්ෂම රෝග මර්ධන ක්‍රමයක් වනවා පමණක් නොව වැයවන කම්කරු ශ්‍රමය ද අවම කරයි.

ශ්‍රී ලාංකීය රබර් වගා ක්ෂේත්‍රයේ මහත් ආන්දෝලනයක් ඇති කිරීමට සමත් වූ සිද්ධියක් නම් 1980 දශකයේ අග භාගයේදී කොරිනස්පෝරා පත්‍ර පතනය නැමැති දිලීර රෝගයක් වසංගත තත්වයෙන් පැතිර යාමයි. අවාසනාවකට මෙන් මෙම නව රෝගයෙන් පීඩාවට පත්වූයේ එවකට ඉතා ජනප්‍රිය රබර් වර්ගයක් වූ ආර්ආර්අයිසි 103 නැමැති ක්ලෝනයයි. වසර 1990 වන විට හෙක්ටයාර් 4,500 ක ප්‍රදේශයක රබර් වගාව මෙම රෝගය ව්‍යාප්ත වීම නිසා ඉවත් කිරීමට සිදුවිය. එම අවස්ථාවේදී රෝගයෙන් පීඩාවට පත් වතු හිමියන්ට සහනාධාර ලෙස වන්දි මුදලක් ප්‍රදානය කළ අතර රෝගය නිසා හානියට පත් වගාබිම්හි එම රෝගයට ඔරොත්තු දෙන ඉතා අධික ඵලදාවක් සහිත ආර්ආර්අයිසි 100 හා ආර්ආර්අයිසි 102 යන ක්ලෝන වගා කිරීමට නිර්දේශ කෙරිනි. මෙහි ප්‍රතිඵලයක් ලෙස අද මෙම භයානක රෝගය ශ්‍රී ලංකාවේ වගාබිම්වලින් සම්පූර්ණයෙන්ම පාහේ තුරන් කිරීමට ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය සමත් වී සිටී.

කොරිනස්පෝරා පත්‍ර පතනයට හේතුකාරක වූ කොරිනස්පෝරා කැසිකෝලා “*Corynespora cassiicola*” නැමැති දිලීරයට අමතරව තවත් ව්‍යාධිජනකයින් දස දෙනෙකු පමණ පසුගිය දශක කිහිපය තුළ රබර් වගා ක්ෂේත්‍රයෙන් හඳුනා ගෙන ඇත. මෙම රෝග කාරකයන්ගේ ව්‍යාප්ත වීමට ප්‍රධානතම හේතුවක් වූයේ ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ නිර්දේශ පිළිබඳ රබර් වගාකරුවන් සහ තවාන් හිමියන් සැලකිල්ලක් නොදැක්වීමයි. කෙසේ වෙතත් මේ වන විට එම රෝග හඳුනා ගැනීම, රෝග කාරකයින්ගේ ජීව විද්‍යාව, රෝග වළක්වා ගැනීම හා මර්ධනය පිළිබඳ සියළුම විස්තර ප්‍රකාශයට පත්කර ඇත (වගුව 3).

**වගුව 3.** *පසුගිය විසිපස් වසර තුළ අළුතින් සොයාගන්නා ලද ව්‍යාධිජනකයින්ගේ ලේඛනය සහ එම ආසාදන පිළිබඳ විස්තර ලබාගත හැකි ප්‍රකාශන*

| ව්‍යාධිජනකයා<br>**Pathogen** | අසාමාන්‍යතාවය<br>**Disorder** | පළමු සොයාගැනීම සහ විස්තර ලබාගත හැකි ප්‍රකාශන<br>**Reference (first record, diagnosis, world distribution & nature of damage)** |
|---|---|---|
| *Fusarium solani* | ෆියුසාරියම් මැලවීම (Fusarium wilt) | Liyanage, A. de S. & Dantanarayana, D.M. (1983). *Trans. Brit. Mycol.Soc.*, **80**: 565-567. |
| *Corynespora cassiicola* | කොරිනස්පෝරා පත්‍ර පතනය (Corynespora leaf fall) | Liyanage, A. de S.; Jayasinghe, C.K.; Liyanage, N.I.S. & Jayaratne, A.H.R. (1986).*J.Rub.Res.Inst.SL.*,**65**: 47-50 |
| *Sclerotium rolfsii* | පාමුල සහ බීජාංකුර කුනුවීම (Collar & hypocotyl rot) | Jayasinghe, C.K.;Liyanage, A. de S. & Warnapura S.S.(1988).*FAO Plant Prot. Bull.*, **36**: 189. |

| ව්‍යාධිජනකයා<br>**Pathogen** | අසාමාන්‍යතාවය<br>**Disorder** | පළමු සොයාගැනීම සහ විස්තර ලබාගත හැකි ප්‍රකාශන<br>**Reference (first record, diagnosis, world distribution & nature of damage)** |
|---|---|---|
| *Phytophthora citricola* as one of the pathogens | ෆයිටොප්තෝරා පත්‍ර පතනය (Phytophthora leaf fall) | Liyanage, N.I.S. (1989). *Plant Path.*, **39**: 438-439. |
| *Thanatephorus cucumeris* | තැනටොෆෝරස් ආසාදනය (Target leaf spot disease) | Jayasinghe, C.K. (1993). *Plant Path.*, **42**: 473-474. |
| *Meloidogyne incognita* | මුල ගැටිති වටපණු ආක්‍රමණය (Root-knot nematode) | Jayasinghe, C.K. & Wettasinghe, D.S. (1993). *FAO Plant Prot. Bull.,* **41**: 36. |
| *Nattrassia mangiferae* | පාදස්ථ පිළිකාව සහ සිටුමැරීම (Foot canker & sudden wilt) | Jayasinghe, C.K. & Silva, W.P.K.(1994). *Plant Path.*, **43**: 938-940 |
| *Geotrichum* sp. | මුල් මතුපිට ජියෝට්‍රිකම් ආක්‍රමණය (Geotrichum associations on roots) | Jayasinghe, C.K. & Wettasinghe, J.L.P.C. (1996). *J.Rub.Res.Inst.SL.,* **78**: 102-105. |
| *Colletotrichum acutatum* as the main cause | කොලිටොට්‍රිකම් පත්‍ර පතනය (Colletotrichum leaf fall) | Jayasinghe, C.K.; Fernando, T.H.P.S.; Priyanka, U.M.S. (1997). *Mycopathologia,* **137**:53-56. |
| *Cylindrocladium quinqueseptatum* | සිලින්ඩ්‍රොක්ලේඩියම් පත්‍ර ලප (Cylindrocladium leaf spot) | Jayasinghe, C.K.; Silva, W.P.K. & Nishantha, N.(2003). *Ann. Rev. Rub. Res. Inst. SL.* 2003:72 |

පසුගිය සියවසරක ඉතිහාසය සලකා බැලීමේදී රබර් රෝග, රබර් වගා ක්ෂේත්‍රයට මහත් බලපෑමක් ඇති කළ බව ඉතා පැහැදිලිව පෙනී යයි. කාලයත් සමඟ රෝග දර්ශනය විවිධ වෙනස්වීම් වලට ලක්වී ඇති අතර මේ වන විට රෝග මර්දනය සඳහා ප්‍රතිරෝධී ක්ලෝන භාවිතයට ප්‍රමුඛත්වය ලබා

දී ඇති අතර අවශ්‍ය අවස්ථා වල දී රසායනික ද්‍රව්‍ය භාවිතය, ජීව විද්‍යාත්මක රෝග පාලනය හා යහපත් කෘෂිකාර්මික පුරුදු භාවිතය නිර්දේශ කෙරේ.

## ස්තුතිය

ගෙවී ගිය සියවසක කාලය තුළ රබර් වගාවේ ව්‍යප්ත වූ රෝග හඳුනා ගෙන, එම රෝග පාලනයට අවශ්‍ය තාක්ෂණය සොයා ගැනීමට වෙහෙස වූ ව්‍යාධිවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා අනෙකුත් අදාළ දෙපාර්තමේන්තුවල කාර්යමණ්ඩලයට අපගේ ප්‍රණාමය හිමි වේ. තවද, මෙම ලිපිය පරිගණක ගත කල පුෂ්පා ගුණසේකර මහත්මියට කතෘගේ විශේෂ ස්තුතිය හිමි වේ.